**ශීර්ෂය 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂ 151- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 4,001.65 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 3,257.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 744.49 ක් හෙවත් සියයට 18.60 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,321.65 | 1,305.87 | 15.78 | 1.19 |
| මූලධන | 2,680.00 | 1,951.29 | 728.71 | 27.19 |
| **එකතුව** | **4,001.65** | **3,257.16** | **744.49** | **18.60** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 3.00 | 3.00 | 2.20 | 5.48 | 30.00 | 20.05 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0089/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 15.13 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 90.16 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0012/0073/000 | 1.01 |
| 6000/0000/00/0013/0040/000 | 0.49 |
| 6000/0000/00/0015/0051/000 | 59.57 |
| 6000/0000/00/0016/0021/000 | 29.09 |
| එකතුව | 90.16 |

**2.5 විගණන නිරීක්ෂණය**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

---------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණු අතර, අනෙක් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| | ----------------- | ----------------- |
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 නොවැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

----------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම 06 කට 2016 ජුනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 33,503,315 ක් වී තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

-------------

අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමේ ශේෂය රු.10,827,954 ක් වී තිබුණි. ඉකුත් වර්ෂවලට අදාළ අග්‍රිම ගිණුම්වල නොපියවා තිබුණු ශේෂ සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ගිණුමට මාරු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට වූ අග්‍රිම ශේෂය තුළ 2010 වර්ෂයට අදාළ පියවා නොතිබුණු ශේෂය රු.මිලියන 8 ක් වී තිබුණි. එසේම 2014 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 1.73 ක් වූ තැන්පතු ශේෂ 03 ක්ද එම ශේෂය තුළ පැවැතුණි.

### 3.4 පොදු තැන්පතු ගිණුම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය තුළ පැවැති රාජ්‍ය සංස්ථාවකට ලියා තිබූ රු.මිලියන 10.52 ක චෙක්පතක් සමාලෝචිත වර්ෂයේදී අවලංගු කර පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ පශ්චාත් වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන හා පශ්චාත් සුනාමි ජීවනෝපාය සහාය සහයෝගිතා වැඩසටහන යන ව්‍යාපෘති දෙක 2014 මාර්තු 31 දින වන විට අවසන් කර තිබුණි. නමුත් එම ව්‍යාපාතිවලට අදාළව රු.791,731 ක ශේෂයක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 15101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශන ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණ ශේෂවල එකතුව රු.1,371,368 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත් ඒවා අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) සංස්ථා හා මණ්ඩලවල සේවය සඳහා ස්ථිර වශයෙන් මුදාහරින ලද නිලධාරීන් 04 දෙනෙකුගේ එකතුව රු.93,006 ක් වූ ණය ශේෂයන්ට අදාළ ණය වාරික 2011 වර්ෂයේ සිට අය කර නොතිබුණි. එම නිලධාරීන්ගේ වත්මන් සේවා තත්ත්වය සොයා බලා එම ණය ශේෂයන් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**අභ්‍යන්තර විගණනය**

---

(අ) අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවැතුණත්, එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව වර්ෂය තුළ පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබූ විගණන කාර්යයන් 33 කින් විගණන කාර්යයන් 28 ක් ඉටු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශය සතු වටිනාකම රු.1,065,000 ක් වූ වාහන 03 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැතුණි.

(ii) අමාත්‍යාංශයෙන් සේවය ලබා ගැනීමට පැමිණෙන ජනතාවට නැරඹීම සඳහා බිම් මහලේ සවි කිරීමට 2014 දෙසැම්බර් 30 දින රු.108,020 ක් වැයකර රූපවාහිණියක් මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වූ 2016 අගෝස්තු 15 දින වන විටත් එම රූපවාහිණිය සවිකිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2015 වර්ෂයට අදාළව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තොබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ අංශ 5 ක වාර්තා එම දිනයට පසුව ඉදිරිපත් කර තිබූ අතර, තවත් අංශ 4 ක වාර්තා විගණන දිනය වූ 2016 අගෝස්තු 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවන්හි ඇතුළත් වත්කම් අයිතමයන් 50 කට අමතරව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍ය නිල නිවස සඳහා රු.1,214,883 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණි. එම වත්කම් අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණු බව සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ දක්වා තිබුණි. ඉකුත් වර්ෂයේදීද එම වත්කම් සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කර තිබුණු අංශ 4 කට අයත් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ලෙජරය අනුව ශේෂය පමණක් දක්වා තිබුණි.

(iv) 2015 වර්ෂයට අදාළ සමික්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබූ භාණ්ඩ ඒකක 30 ක ඌණතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

2015 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ 151 -1-1-0-2003 දරන වැය විෂයය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණත්, වර්ෂය අවසාන වන විට එම වැය විෂයයට අදාළව රු.300,663 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.8 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 487(3) | 1,009,156 | අවිනිශ්චිත අවස්ථා අරමුදලෙන් ලබා ගෙන තිබූ අත්තිකාරම්වලින් වියදම් නොකළ ඉතිරි වූ මුදල පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 755 | - | අමාත්‍යාංශ ප්‍රවෘත්ති අංශය වසා තිබුණද එහි පැවති වත්කම් අමාත්‍යාංශය වෙත භාරදීම සඳහා උපදෙස් ලබා දී නොතිබුණි. එබැවින් එම වත්කම්වල පැවැත්ම හා සුරක්ෂිතභාවය තහවුරු කර නොතිබුණි. |

## 3.9 විදේශාධාර ව්‍යාපෘති

### 3.9.1 ශ්‍රී ලංකා මහද්වීපික තටාකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2012 දෙසැම්බර් 31 දින සිට ව්‍යාපෘති කටයුතු නවතා තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් නාවික සැතපුම් සීමාවට එපිටින් ඇති මහද්වීපික තටකය සඳහා ඉල්ලීම් කිරීම, අත්පත් කර ගැනීම සහ එහි සම්පත් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය සඳහා භාවිතා කිරීම අරමුණු කර ගෙන තිබුණත්, එම අරමුණු ඉටු කරගෙන නොතිබුණි. එම කාර්යභාරය නිමකිරීම සඳහා 2012 අප්‍රේල් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර බහුවිධ විෂයය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් 11 කගෙන් සැදුම්ලත් නොඇක් නම් වූ කමිටුවක් පත්කර තිබුණි.

ශ්‍රී ලංකා මහද්වීපික සීමාවේ බාහිර මායිම පිළිබඳ හිමිකම් පෑමේ ශ්‍රී ලංකාවේ ඉල්ලීම 2025 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාව හමුවේ සාකච්ඡාවට ගැනීමට නියමිතව තිබුණි. එම අවස්ථාව වන විට ශ්‍රී ලංකාවේ හිමිකම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනිම සහ සමුද්‍රික සම්පත් හා සමුද්‍රික කටයුතු ගවේශණය හා පරිහරණය සම්බන්ධව ප්‍රතිපත්තියක් සකස් කිරීමද මෙම කමිටුවේ කාර්යභාරයට ඇතුළත් කර තිබුණි. මෙම කමිටුව ක්‍රියාකාරිව පවත්වා ගැනීම සඳහා ක්‍රියාකළ යුතු ආයතන 3 අතරින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය එක් ආයතනයක් වී තිබුණි. නමුත් අදාළ කමිටුවේ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමට හා ඒ සඳහා නියෝජිතයෙකු පත් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### 3.9.2. ව්‍යාපෘති ගිණුම්වල වූ මුදල් ශේෂ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පශ්චාත් සුනාමි පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අයත් බැංකු ගිණුම් 2 ක එකතුව රු.4,499,791 ක් වූ ශේෂද, 2009 ජුනි 30 දින අවසන් වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අයත් බැංකු ගිණුමක රු.28,618 ක ශේෂයක්ද, 2015 දෙසැම්බර් 31 දින වන විට පැවතුණ අතර එම ඉතිරි මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

## 3.10 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.10.1 ධීවර වරාය හා නැංගුරම් තොටුපළ ඉදිකිරීම් හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2013 වර්ෂයේ ආරම්භ කර තිබූ ධීවර වරාය හා නැංගුරම් තොටුපල ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මධ්‍යකාලීන අයවැය රාමුවක් යටතේ 2015 – 2017 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාරය නිර්දේශ කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 5,300 ක ප්‍රතිපාදන ලබා දීමට ද එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා මෙහෙයවීමේ ඒකකය ශක්තිමත් කිරීමටත්, ක්‍රියාත්මකව පවතින වරාය ව්‍යාපෘති 6 ට අමතරව නව ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීම සඳහාත්, ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තු එලෙසම ක්‍රියාත්මක කිරීම හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ඉදිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, 2015 නොවැම්බර් 06 දින අමාත්‍ය මණ්ඩල තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘතිය 2017 වර්ෂය අවසන් වන විට නිම කිරීම සඳහා එහි කාලය දීර්ඝ කර තිබුණි. එම කාලය ආවරණය වන පරිදි ව්‍යාපෘති සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේදී ලබාදී තිබූ අනුමැතිය ප්‍රකාරව 2015 වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් කාර්යයන් අවසන් කළ යුතුව තිබුණි. ක්‍රියාත්මකව පැවැති ව්‍යාපෘති 06 කට අදාළව එහි ප්‍රගතිය පහත සඳහන් වේ.

(i) ගාල්ල වරායේ නව ජැටිය නිර්මාණය කර ඉදිකිරීමේ කාර්යය ආරම්භකර නොතිබුණි.

(ii) කළමැටිය ධීවර වරාය ඉදිකිරීමේ කාර්යය 2015 වර්ෂය අවසන් වන විට එහි භෞතික කාර්යසාධනය සියයට 36 ක් වී තිබුණි. හම්බන්තොට ධීවර වරායේ පවතින දියකඩනය දිර්ඝ කිරීම, පලඟතුරෙයි පෝරුතොට ගොඩබෑම් මධ්‍යස්ථානයේ දියකඩනය දිර්ඝ කිරීම යන කාර්යයන්හි භෞතික කාර්යසාධනය සියයට 50 ක් බැගින් වී තිබුණි.

(iii) 2015 වර්ෂය අවසන් වන විට නිමකළ යුතුව තිබුණු කයිකාවල නැංගුරම්පල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණත් එහි භෞතික ප්‍රගතිය සියයට 2 ක් හා මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 84.84 ක් වී තිබුණි. නමුත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබීම නිසා ව්‍යාපෘතිය නවතා තිබුණි. ඒ අනුව වැය කර තිබූ රු.මිලියන 84.84 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(iv) මරදාන නැංගුරම්පල ඉදිකිරීමේ කටයුතු නිමකර තිබුණද, ඒ සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් ඉන් සිදුවන පාරිසරික බලපෑම නිගමනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ අයවැය යෝජනා අනුව 2016 වර්ෂයේ දී නිමකළ යුතු කරෙයිනගර් බෝට්ටු අංගනය ඉදිකිරීම, වෙන්නප්පුව, දොඩන්දුව ධීවර වරායන් හා පැරලිය නැංගුරම්පල යන ඉදිකිරීම් සහ මීගමු කළපුව සංවර්ධනය කිරීම යන කාර්යයන්ගේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 22.63ක් වූ නමුත්, භෞතික කාර්යසාධනය සියයට 0 ක් විය.

(ඈ) ගන්දර, ගුරුනගර් හා සිලාවතුර ප්‍රදේශවල ධීවර පහසුකම් සංවර්ධනය සඳහා සැලැසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම යන කාර්යයන් සමාගමක් මගින් ඉටු කර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලික අධ්‍යයනය සඳහා කොන්ත්‍රාත්තු පැවරීමේ දී කලින් එකඟ වූ ස්ථිර ගාස්තුවකට කාර්ය පවරා නොතිබුණි. මේ හේතුවෙන් අධ්‍යයනය සඳහා ඉදිරිපත් කර තිබූ රු. මිලියන 18,221 ක් වූ ඇස්තමේන්තුවෙන් ප්‍රතිශත අගයක් ලෙස කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු.මිලියන 159 ක ගාස්තුව ප්‍රසම්පාදන කමිටුව අනුමත කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ සැලැසුම් හා ඇස්තමේන්තු, කමිටුවක් විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සංශෝධිත ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 12,045 ක් ලෙස ගණනය කර තිබුණි. එම ගණනය කරන ලද පිරිවැයට අදාළ කොන්ත්‍රාත්කරුගේ උපදේශණ ගාස්තුවෙන් සියයට 70 ක් හෙවත් රු.මිලියන 8.56 ක් ( එකතු කළ අගය මත බදු සහිත) කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම සංශෝධිත ගාස්තු හා සැලසුම්, ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොතිබුණි.

(iii) ගුරුනගර් වරාය ඉදිකිරීමට අදාළ අධ්‍යයන වාර්තාව සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර ඉදිරිපත් කර තිබූ වාර්තාව අනුව එහි පිරිවැය රු.මිලියන 2,432.2 ක් වුවද ව්‍යාපෘතියෙහි පිරිවැය රු. මිලියන 2,520.9 ක් ලෙස සලකා කොන්ත්‍රාත්කරුගේ උපදේශක ගාස්තුව ගෙවා තිබුණි. මේ හේතුවෙන් රු.590,884 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) කොන්ත්‍රාත්කරුට ගාස්තු ගෙවීමේදී අනපේක්ෂිත හා මිල ගණන් වෙනස්වීම් සම්බන්ධයෙන් ඇතිවිය හැකි පිරිවැයද ඇතුළත් ඇස්තමේන්තු පදනම් කරගෙන ගණනය කළ උපදේශක ගාස්තු ගෙවීම හේතුවෙන් අනාගතයේ ඇති විය හැකි අවිනිශ්චිත පිරිවැයක් සඳහා රු.8,146,264 ක් ගෙවා තිබුණි.

(v) අදාළ මූලික අධ්‍යයන වාර්තා ලබාගැනීමෙන් අනතුරුව ගන්දර හා සිලාවතුර වරායන් ඉදිකිරීම අත්හැර දමා තිබුණි.

(ඉ) මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය රු.මිලියන 1,000 කට ඇස්තමේන්තු කර තිබුණි. එහි ආරම්භක කටයුතු වෙනුවෙන් 2014 දෙසැම්බර් 24 දින ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිවරයා වෙත රු.5,000,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එම අත්තිකාරම් පියවීමක් සිදු නොකර එය වියදමක් ලෙස ගිණුම්ගත කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අතහැර තිබුණි.

(ඊ) අමාත්‍ය මණ්ඩලය විසින් පත්වීම් නිර්දේශ නොකිරීමට තීරණය කර තිබූ විශ්‍රාමික නිලධාරියෙකු 2015 අප්‍රේල් 10 දින සිට මාස 5 ක කාලයක් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරට පත් කර තිබුණි. විශ්‍රාමිකයින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛවලට පටහැනිව එම ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට සමාලෝචිත වර්ෂයේදී රු.356,313 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

### 3.10.2 දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ධීවර වරාය හා නැංගුරම් තොටුපල ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 77 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ දික්ඕවිට ධිවර වරායේ ව්‍යාපෘතිය සඳහා මාරුකර ගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඒ සඳහා රු.68,691,077 ක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය මගින් වරාය පරිශ්‍රයේ ඉදිකර තිබූ අයිස් යන්ත්‍රාගාරයට අදාළ කොන්ත්‍රාත් බිල්පත් පියවීම ප්‍රමාද වීම මත රු.3,279,729 ක පොලී මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කළ යුතු ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ සහතිකය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය නිමකර භාරදීමට එකඟවී තිබුණු දිනයට දින 134 ක ප්‍රමාදයකින් පසුව ව්‍යාපෘතිය භාර දී තිබුණි. අමාත්‍යාංශය කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව එම ප්‍රමාද කාලයට අයත් බිල්පත් වටිනාකමෙන් සියයට 6.05 ක් හෙවත් රු.6,509,041 ක ප්‍රමාද ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඉ) දික්ඕවිට ධීවර වරායට අදාළ කාර්යභාරයට අයත් නොවූ නැව් හා සබ්මැරීන් නිර්මාණය සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංගයක් රු.9,664,584 ක් වැයකර 2014 අප්‍රේල් 30 දින මිලදී ගෙන තිබුණි. මෙම මෘදුකාංග බලපත්‍රය සඳහා එළඹ තිබූ ගිවිසුම අනුව එහි වලංගු කාලය වසර 05ක් වී තිබුණි. විගණන දින වන විට එය මිලදී ගෙන වර්ෂ 03 කුත් මාස 06 ක කාලයක් ගතවී තිබුණද, කිසිදු නිර්මාණයක් සිදු නොකර නිෂ්කාර්යව පැවැතුණි.

(ඊ) ඉහත (ඉ) හි සඳහන් මෘදුකාංගය 2016 පෙබරවාරි මාසයේදී අමාත්‍යාංශය යටතේ වූ සී/ස සීනෝර් පදනමට භාර දී තිබුණි. එම සමාගමද නැව් හා සබ්මැරීන නිෂ්පාදනයක් සිදු නොකරන බැවින් හා එහි නිලධාරින් මෘදුකාංගය භාවිතා කිරිමට අවශ්‍ය පුහුණුවක් ලබා නොතිබීම නිසා එහි ප්‍රයෝජනවත්භාවය අවම වී තිබුණි. මේ හේතුවෙන් ඒ සඳහා වැය කළ රු.මිලියන 9.7 ක් රජයට සිදු වූ පාඩුවක් ලෙස නිරික්ෂණය විය. මෙම මෘදුකාංගය මිලදී ගැනිමට නිර්දේශ කළ ව්‍යාපෘතියේ නාවික සැලැසුම් ශිල්පියා 2016 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘතියෙන් ඉවත් වී තිබුණි.

(උ) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය මගින් එයට අදාළ නොවූ සී/ස සීනෝර් පදනමට අයත් මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 180 ක් වැය කර තිබුණි. ධීවරයන්ට සහන මිලට යාත්‍රා අලුත්වැඩියා කර දීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර ක්‍රියාත්මක කර එම වියදම් පියවා ගැනීම සඳහා කටයුතු කරන ලෙස 2013 මාර්තු 05 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී නියෝග කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත්, ඒ සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණු අතර, ධීවරයන් දැනුවත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සී/ස සීනෝර් පදනම විසින් සහන මිලට ධීවර යාත්‍රා අලුත්වැඩියා කිරිම් කිසිවක් සිදු කර නොතිබුණි.

(ඌ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ 2015 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2016 මාර්තු 17 දිනට පෙර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. නමුත් 2016 අප්‍රේල් 30 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(එ) 2014 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ 2015 ඔක්තෝබර් මාසයේ සිදුකර තිබුණි. එම භාණඩ සමික්ෂණ වාර්තා නියමිත දින සිට වර්ෂයක ප්‍රමාදයක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තා අනුව අනාවරණය කර තිබූ භාණ්ඩ වර්ග 27 කට අදාළ ඌනතා 61 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව කටයුතු කර ද නොතිබුණි.

**3.10.3 මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබූ ව්‍යාපෘති**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **මව් යාත්‍රා 02 ක් මිලදී ගැනීම.**

**------------------------------**

ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත මරුවැල්පන්න ක්‍රමය උපයෝගී කරගෙන නෙලා ගැනිමත්, බහු දින ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් අරමුණු කරගෙන මව් යාත්‍රා 02 ක්, එකතුව රු.326,016,000 කට මිලදී ගැනීමට 2007 වර්ෂයේ දී අමාත්‍යාංශය විදේශීය සැපයුම්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 40 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉකුත් වර්ෂයේ සැපයුම්කරු හා උපදේශක වෙතින් ඉල්ලුම් කළ තොරතුරු ලබා නොදීම නිසා අදාළ යාත්‍රා මිලදී ගැනීම සිදු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ii) මෙම මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේ සිට අඛණ්ඩව ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදීද අදාළ මිලදී ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සමුච්චිත වියදම රු.113,556,801 ක් වී තිබුණි. එම සම්පූර්ණ වියදම නිෂ්ඵල වී තිබුණි.

(iii) 2013 අගෝස්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඵලදායී ලෙස අරමුදල් උපයෝගී කර නොගැනීම සම්බන්ධයෙන් හේතු පැහැදිලි කරන ලෙස ලේකම්වරයාට දැනුම් දී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කිසිදු ප්‍රගතියක් ලේකම්වරයා විසින් වාර්තාකර නොතිබුණි.

**(ආ) ධීවර ප්‍රජාව බලගැන්වීම**

**-------------------------**

ධීවර ප්‍රජාව බලගැන්වීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.159,366,549 ක ප්‍රතිපාදන සලසා තිබු අතර ඉන් රු.154,616,552 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම කාර්යය සඳහා රු.58,746,696 ක් වැය කර තිබුණත්, ධීවරයන් සඳහා මිලදී ගන්නා ලද කොල්ලෑ, ඔරු, පැලට් හා දැල් අදාළ ධීවරයින්ට ලබාදුන් බව තහවුරු කර නොතිබුණි. ඒ අනුව වැය කිරීම් ධීවර ප්‍රජාව බලගැන්වීම සඳහාම යොදවා තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) 2015 වර්ෂයේදි අමාත්‍යාංශයේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා රු.මිලියන 15 ක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

**(ඇ) අඩු ආදායම්ලාභි ධීවර ප්‍රජාවට වැසිකිළි ඉදිකිරීම සඳහා ආධාර ලබාදීම**

**---------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම යටතේ ධීවර දිස්ත්‍රික්ක 14 ක අඩු ආදායම්ලාභී ධීවරයන්ට වැසිකිළි 645 ක් ඉදිකිරීම සඳහා රු.19,080,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. දිස්ත්‍රික්ක 4 ක් සඳහා රු.7,005,000 ක පමණක් ආධාර මුදල් නිදහස් කර තිබුණි.

(ii) වැසිකිළි ඉදිකිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ මූලික සැකසුම් කටයුතු අවසන් කිරීමෙන් පසු ධීවර පරීක්ෂක හා ග්‍රාම නිලධාරි නිර්දේශයෙන් හා දිස්ත්‍රික් නිවාස කමිටු අධීක්ෂණය හා අනුමැතිය යටතේ ඉදිකිරීම් සඳහා රු.30,000 ක්ද, අළුත්වැඩියා කිරීම් සඳහා රු.15,000 ක් ද ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතිය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට ලක්කර භෞතික ප්‍රගතිය පරීක්ෂා කර නොතිබුණි.

**(ඇ) සංවර්ධන කාර්යයන් සඳහා වෙනත් ආයතනවලට ප්‍රතිපාදන ලබා දීම.**

**---------------------------------------------------------------------**

2015 වර්ෂයේ අමාත්‍යාංශයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට රු.මිලියන 96.57 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේම ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය වෙත අත්තිකාරම් වශයෙන් රු.මිලියන 1.54 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 98.11 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 55.08 ක් උපයෝජනය කර තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනයට අදාළව ප්‍රමාණවත් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණු අතර ලබාදුන් භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණු අවස්ථා තුනක් සහ ඌන භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය වූ අවස්ථා දෙකක් විය.

**3.11 කාර්යසාධනය**

**-----------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ 2013 – 2016 වර්ෂ සඳහා මධ්‍යකාලීන ප්‍රතිපත්ති රාමුව තුළ ඇතුළත් ප්‍රධාන කාර්යයක් වූ රජයට අයත් ධීවර යාත්‍රා මෙහෙයවීම හා කළමනාකරණය සඳහා වූ සැලැසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර හෝ අයවැය මඟින් ප්‍රතිපාදන සලසාගෙන හෝ නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 10,082 කින් හෙවත් සියයට 29 කින් අඩු වී තිබුණි. ආනයන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 11,860 කින් හෙවත් සියයට 63 කින් වැඩි වී තිබුණි. මේ නිසා ශුද්ධ විදේශ විනිමය ඉපයීම රු. මිලියන 6,013 ක සෘණ අගයක් බවට පත්ව තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 62 ක පිරිහීමක් වී තිබුණි. තවද අපනයන ඉල්ලුම් සඳහා ධීවර අංශයේ දායකත්වය ඉකුත් වර්ෂයේ සියයට 2.4 ක්ව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ එය සියයට 1.8 ක් දක්වා පහත වැටී තිබුණි. එම තත්ත්වය යටතේ සමලෝචිත වර්ෂයේ මත්ස්‍ය අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීම නම් වූ අමාත්‍යාංශයේ අරමුණට ළඟාවීමෙහිලා ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ මෙට්‍රික් ටොන් 535,050 ක්ව තිබූ ජාතික මත්ස්‍ය නිෂ්පාදනය සමාලෝචිත වර්ෂයේ මෙට්‍රික් ටොන් 520,190 ක් දක්වා මෙට්‍රික් ටොන් 14,860

කින් එනම්, සියයට 2.7 කින් අඩු වී තිබුණි. දළ දේශිය නිෂ්පාදනය සඳහා ධීවර අංශයේ දායකත්වය ස්ථාවර මිල අනුව (2010 පදනම්ව) 2014 වර්ෂයේ රු. මිලියන 120,657 ක් වි තිබුණි. 2015 වර්ෂයේ එය රු. මිලියන 117,453 ක් ලෙස රු. මිලියන 3,204 කින් එනම්, සියයට 2.7කින් පහත වැටී තිබුණි. මෙහිදී කිලෝග්‍රෑම් 25.76 ක්ව තිබු ඉකුත් වර්ෂයේ එක් පුද්ගලයෙකු සඳහා වන දේශිය මත්ස්‍ය නිෂ්පාදනයද, සමාලෝචිත වර්ෂයේ කිලෝග්‍රෑම් 24.81 ක් දක්වා පහත වැටි තිබුණි. මේ හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය හා ආහාර සුරක්ෂිතාවය ඉහළ නැංවීමේ අමාත්‍යාංශ අරමුණ ඉටුකර ගැනීමෙහිලා සමාලෝචිත වර්ෂය තුළදි ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

**(ඇ) සැලැසුම් කිරිම**

2015 වර්ෂයේදී අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සැලැසුම් කිරිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අයවැය ලේඛනයේ ඇතුළත් රු.මිලියන 2,446 ක් වු ව්‍යාපෘති 10 ක් එහි ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් රු.මිලියන 135 ක ප්‍රතිපාදන සලසා තිබු ව්‍යාපෘති 4 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වු ක්‍රියාකාරකම් 09 ක භෞතික හා මුල්‍ය කාර්යසාධනය සියයට 20 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.12 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දිර්ඝ ප්‍රමාදයන්**

බැංකු ගිණුම් 03 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දිර්ඝ ප්‍රමාදයන් නිරික්ෂණය විය.

**(ආ) අක්‍රිය බැංකු ගිණුම්**

අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන ගිය බැංකු ජංගම ගිණුම් 21 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 6 ක් දක්වා කාල පරාසයක සිට අක්‍රියව පැවැතිණි. ඒ අතරින් ගිණුම් 4 කට අදාළව අක්‍රියව පැවති ශේෂය රු. 4,785,975 ක් වී තිබුණි.

**3.13 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු අමාත්‍යාංශයේ ගර්හිත තත්ත්වයේ වු වාහන 10 ක් අපහරණය කිරිමට අදාළව පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරිමට නිර්දේශිත වාහන සම්බන්ධ විස්තර අදාළ ආකෘතියේ සම්පූර්ණ කර 2015 අප්‍රේල් 10 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණ කරන වාහන තක්සේරු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙක් ඇතුළු තක්සේරු මණ්ඩලයක් පත් කළ යුතුව තිබුණි. නමුත් වාහන 10ක් අපහරණය කිරිම සඳහා ඔටෝමොබයිල් සංගමය වෙත යවා තක්සේරු වාර්තා ලබා ගෙන තිබුණත්, චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාර තක්සේරු මණ්ඩලයක් පත් කර නොතිබුණි. එසේම චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි නියමිත කාල සීමාවට ප්‍රථම අපහරණ කටයුතු අවසන් කර නොතිබුණු අතර 2015 ජුලි 30 දිනට ප්‍රථම අපහරණය සම්බන්ධ තොරතුරු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.14 අවිධිමත් ගනුදෙනු**

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම.**

--------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ධීවර සමිති හා ධීවරයින් සඳහා ගොඩබෑමේ ආධාරක, මසුන් ගබඩාකරන පෙට්ටි හා මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි ලබා දීම.**

-------------------------------------------------------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ධීවර වරාය ආශ්‍රිත ගොඩබෑමේ පහසුකම්, සනීපාරක්ෂක හා සෞඛ්‍යාරක්ෂණ මට්ටම ඉහළ නැංවීමේ වැඩ සටහන යටතේ ධීවර සමිති හා ධීවරයන් සඳහා ධීවර ආම්පන්න නිෂ්පාදනය කර සැපයීම සඳහා රු.35,950,900 ක් වූ කොන්ත්‍රාත්තුව රජයේ සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:2:1 හා 2:4:1 මාර්ගෝපදේශ ප්‍රකාර තරඟකාරි ලංසු කැඳවා නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:5:1 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව අදාළ රාජ්‍ය සමාගමට සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස පිරිනැමීමට 2015 නොවැම්බර් 23 දින ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර තිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2015 දෙසැම්බර් 31 දින වන විට මසුන් ගොඩබෑමේ ආධාරක 200 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. මසුන් ගබඩා කරන පෙට්ටි 25 ක්, මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි 125 ක් හා මසුන් ගොඩබෑමේ ආධාරක 300 ක් සැපයීමට අදාළව රු. මිලියන 11.88 ක් 2015 දෙසැම්බර් 31 දින වැය ගිණුමේ ගිණුම්ගත කර ලියා තිබුණු චෙක්පත් බැංකුව වෙත ඉදිරිපත් නොකර අත රඳවාගෙන 2016 අගෝස්තු 12 දින ගෙවීම් කර තිබුණි.

(iv) මෙම ව්‍යාපෘතිය යුරෝපා සංගමයේ නියෝජිතයින්ගේ නිරීක්ෂණයන්ට ලක්වූ ධීවර වරායන් සඳහා අදාළ උපකරණ ලබා දීමට කඩිනම් ප්‍රසම්පාදනයක් වශයෙන් ක්‍රියාත්මක කර තිබුණද, එම කාලය තුළ මසුන් ගොඩබෑමේ ආධාරක 100 ක් පමණක් නිපදවා තිබුණි.

(v) අදාළ උපකරණ ධීවරයන්ට හෝ ධීවර සමිතිවලට භාරදුන් බවට හෝ භාරගත් බවටත් උපකරණ පරිහරණය කරන බවටත් විගණිත දින වූ 2016 ජූලි 15 දින වන විටත් තහවුරු කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණ ඉටු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) **යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.**

**--------------------------------------------**

ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු සිදු කරනු ලබන යාත්‍රා සඳහා යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අදාළ යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මූලික අධ්‍යනයක් සිදු කර සැලසුමක් සකස් කිරීමට හෝ වියදම් ඇස්තමේන්තුවක් සකස් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ii) යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7 මාර්ගෝපදේශය ප්‍රකාර ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි.

(iii) සැපයුම්කරු තෝරාගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.4 මාර්ගෝපදේශය ප්‍රකාර උපරිම තරඟයක් ඇතිකිරීම පිණිස ප්‍රසම්පාදන දැන්වීම් සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණයක් ලබාදීමට කටයුතු කර නොතිබුණි. සමාගම් 22 ක් විසින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කර තිබූ යෝජනා ඇගයීමෙන් පසු සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(iv) 2010 අගෝස්තු 04 දිනැති අංක 444 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ යෝජනා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) ස්වේච්ඡා යෝජනා ඇගයීම පිළිබඳ තාක්ෂණික දැනුම හා පළපුරුද්දක් සහිත කමිටුවක් මඟින් සිදුකර නොතිබුණු අතර, තෝරාගත් සමාගම්වල සජීවී ප්‍රදර්ශණ ඇගයීමද සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් සැදුම්ලත් තාක්ෂණ ඇගයීම් කමිටුවක් මඟින් සිදුකර නොතිබුණි.

(vi) සජීවී ප්‍රදර්ශණවලින් අනතුරුව තෝරාගත් සැපයුම්කරුගේ තාක්ෂණික හා මූල්‍ය යෝජනාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණු බව සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණ ද ඒ සඳහා අනුමැතියක් ලබාදී නොතිබුණි.

(vii) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් ව්‍යාපෘතියට අදාළ ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම තොරතුරු තාක්ෂණික විශේෂඥයන් ලවා ව්‍යාපෘතියේ ඇගයීමක් සිදු කළ යුතු බවටත්, පසු විකුණුම් පිරිවැය තීරණය කර ගිවිසුමකට එළඹිය

යුතු බවටත්, බලපත්‍ර පිරිවැය වර්ෂ 10 ක මිල උච්ඡාවචන සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු බවටත් හා ව්‍යාපෘති පිරිවැය ජාත්‍යන්තර මිල ගණන් සැලකිල්ලට ගෙන විශේෂඥ කණ්ඩායමක් ලවා තහවුරු කළ යුතු බවටත් නිර්දේශ කර තිබුණි. නමුත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(viii) 2011 දෙසැම්බර් 15 දින අමාත්‍ය මණ්ඩල තීරණය මගින් යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලෙස නියම කර තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි.

(ix) සැපයුම්කරු තෝරාගැනීමේ දී ව්‍යාපෘතියේ පිරිවැය පිළිබඳ කිසිදු සඳහනක් කර නොතිබූ අතර තෝරා ගැනීමෙන් පසු ස්වේච්ඡා යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ මිල, සැපයුම්කරු විසින් අවස්ථා 2 ක දී වැඩි කිරීමට කටයුතු කර තිබුණි.

(x) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ සාකච්ඡා සම්මුති කමිටුව සැපයුම්කරු සමඟ සාකච්ඡා කර සියයට 1.6 කින් ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය පහත දැමීමට එකඟ කරගෙන තිබුණි. එසේ වුවද යුරෝ 6,510,000 කට බාහිර ආයතනයකින් මිලදී ගෙන සවිකරනු ලබන සන්නිවේදන කට්ටලවල තරඟකාරී වෙළඳපල මිල ඍජුවම ලබා ගැනීමට කමිටුව විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් එහි මිල යුරෝ 60,000 කින් පමණක් අඩුකර ගෙන තිබුණි. කෙසේ වුවද, යෝජනාවේ ඇතුළත් අයිතම 3 ක් ඉවත් කිරීම, නඩත්තු පිරිවැය ඇතුළු ඉදිරි ගෙවීම් සඳහා අමතර ගෙවීමක් ඇතුළත් කිරීම, අයිතම 2 ක මිල ඉහළ නැංවීම වැනි හේතු නිසා ද කමිටුව විසින් රජයට උපරිම වාසිදායක අන්දමින් කටයුතු කර නොතිබුණු බව අනාවරණය විය.

(xi) යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ දී අනුගමනය කර තිබූ අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීම වර්ෂ 03 ක් ප්‍රමාද වීම නිසා මිල ගණන් වැඩි වීමෙන් යුරෝ මිලියන 1.7 ක ඍජු අලාභයක් සිදුව තිබුණි. යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට ප්‍රමාද වීම නිසා යුරෝපීය මත්ස්‍ය තහනම තුළින් අපනයන ආදායම් අඩු වීමෙන්ද ශ්‍රී ලංකාවට අලාභ සිදුව තිබුණි.

(xii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව ඉටුකර නොතිබුණි. ලංසු කැඳවීම, ලංසු ඇගයීම, ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාව, සුරක්ෂණ ලබාගැනීම, ලංසුකරුවන්ගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂා කිරීම හා කොන්ත්‍රාත් ප්‍රදානය යන කාර්යයන් මෙම ප්‍රසම්පාදනය තුළ ඉටුකර නොතිබුණි. ප්‍රසම්පාදන කමිටුවක් පත්කර ප්‍රසිද්ධ මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම වෙනුවට ස්වේච්ඡා යෝජනාවක් පිළිගැනීම හේතුවෙන් වැඩි වියදමක් සිදු කර තිබුණි.

**(ආ) ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා ව්‍යායාම උපකරණ මිලදී ගැනීම.**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශ පරිශ්‍රයේ රු.14,458,000 ක් වැය කර නවීන කායවර්ධන උපකරණ සහිත ශරීර සුවතා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට අදාළව උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මූලික පිරිවැය ඇස්තමේන්තු සකස් නොකිරීම, ප්‍රමාණවත් සැපයුම්කරුවන් සංඛ්‍යාවකින් මිල

ගණන් නොකැඳවීම, මිල ගණන් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම, ලංසුකරුවන්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීමට අවස්ථාව සලසා නොතිබීම යන අඩුපාඩු නිරික්ෂණය විය.

(ii) ව්‍යායාම උපකරණ මිලදී ගැනීමේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ නිර්දේශවලට පටහැනිව මිල අධික උපකරණ මිලදී ගැනීමට කටයුතු කර තිබීම නිසා රු. 670,000 ක පමණ මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි..

(iii) මෙම ව්‍යායාම උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛනයක ඇතුළත් කර නිලධාරියෙකු භාරයට පත්කිරීමට කටයුතු කර නොතිබුණු අතර ක්‍රමවත්ව සේවා කිරීම හා නඩත්තු කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**(ඇ) පතුලේ එලන දැල් කර්මාන්තය නවතා දැමීම වෙනුවෙන් විකල්ප දැල් ආම්පන්න ලබාදීම.**

සාම්ප්‍රදායික පතුලේ එලන දැල් භාවිතය තිරසාර මත්ස්‍ය කළමනාකරණයට හානිදායක වී තිබුණි. එම දැල් ආම්පන්න භාවිතය අවම කර ධීවරයන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රමවේදයන්ට යොමු කළ යුතුව තිබුණි. මේ සඳහා පතුලේ එලන දැල් කර්මාන්තය නවතා දැමීම වෙනුවෙන් ගුරුනගර් ප්‍රදේශයේ ධීවර කාර්මිකයින් 158 දෙනෙකු සඳහා ධීවර දැල් පීස් 20 ක්, බෝයා 600 ක්, ව්වයින් කිලෝග්‍රෑම් 3 ක් හා ෆයිබර් මත්ස්‍ය පෙට්ටි 01කින් සමන්විත ධීවර ආම්පන්න කට්ටල 158 ක් ලබා දීමට නිර්දේශ කර තිබුණි.

මෙහි පළමු අදියර යටතේ එක් අයෙකුට දැල්පීස් 05 ක් බැගින් ලබාදීමට තීරණය කර දැල් පීස් 790 ක් නිෂ්පාදනය කර සැපයීම වෙනුවෙන් රාජ්‍ය සමාගමකට රු.මිලියන 16.84 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:2:1 මාර්ගෝපදේශය හා 2:4:1 මාර්ගෝපදේශය ප්‍රකාරව තරඟකාරී ලංසු කැඳවීම තුළින් සැපයුම්කරු තෝරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:8:4 මාර්ගෝපදේශය ප්‍රකාර ලංසු කැඳවීමේදි, ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:10 මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(iii) තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරු තෝරාගැනීමේදී කොන්ත්‍රාත්කාර සමාගම ධීවර ආම්පන්න සැපයීමේදී දීර්ඝ කාලීනව ලබා ඇති පළපුරුද්ද හා භාණ්ඩවල ගුණාත්මක භාවයද, විශේෂයෙන්ම දැල් ආම්පන්නවල කල්පැවැත්ම හා යොදාගෙන ඇති අමුද්‍රව්‍යවල පිරිවිතරයන්ද, රජයේ ආයතනයක් වශයෙන් ඇති වගකීම් සහගත බව කෙරෙහි අවධානය යොමු කරන ලද බව සඳහන් කර තිබුණත්, අදාළ සමාගම ධීවර දැල් වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන සපයනු ලබන බව සාමාන්‍යාධිකාරි විසින් තහවුරු කර තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:1 මාර්ගෝපදේශය අනුව අමාත්‍යාංශය විසින් සැපයුම්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. උපකරණ සැපයීමට දින 93 ක් ප්‍රමාද වී තිබුණද එම ප්‍රමාද කාලය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමටද අසමත් වී තිබුණි.

(v) සැපයුම්කරු ධීවර දැල් ඒකකයක් සඳහා 2014 ජුලි 28 දින ඉදිරිපත් කර තිබු රු.19,384 ක මිල 2014 සැප්තැම්බර් 24 දින රු. 21,322 ක් ලෙස සංශෝධනය කර තිබුණි. ඒ අනුව ඒකකයක මිල රු.1,938 කින් වැඩි වී තිබුණද ඒ පිළිබඳව

සැලකිලිමත් නොවී රු.21,323 ක මිල පිළිගැනීමට ප්‍රසම්පාදන කමිටුව කටයුතු කිරීම හේතුවෙන් රු.1,531,532 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(vi) ප්‍රතිලාභීන් 158 අතුරින් ධීවරයන් 100 ක් දෙනෙකු වෙත දැල් කට්ටල බෙදා හරින ලද බවට නාමලේඛනයක් ඉදිරිපත් කර තිබුණද, ධීවරයින් 58 දෙනෙකු සඳහා දැල් බෙදා හරින ලද බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(vii) පතුලේ එලන දැල් කර්මාන්තය නවතා දැමීම සඳහා ධීවරයන් විසින් දැල් කට්ටල 20 කින් සමන්විත ධීවර ආම්පන්න කට්ටලයක් ලබාදෙන ලෙස ඉල්ලා එය නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඔවුනට දැල් කට්ටල 05 ක් පමණක් ලබාදීමට තීරණය කර තිබුණු අතර අවශ්‍ය අනෙකුත් උපකරණ කිසිවක් ධීවරයින්ට ලබාදීමට ද කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වූ පරිදි ධීවරයින් විසින් පතුලේ එලන දැල් කර්මාන්තය නවතා දමා පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රමවේදයන්ට යොමු කරවීමට තාක්ෂණික සහයෝගය ලබාදීමේ ඉලක්කය ඉටුකරගෙන නොතිබුණි.

## 3.15 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සඳහා මිලදී ගෙන තිබූ ජීප් රථයක් වරායට ලඟා වන විට එය නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගැනීම අමාත්‍යාංශය විසින් ප්‍රමාද කර තිබුණි. මේ හේතුවෙන් වාහනය නිදහස් කර ගැනීමේ දී ප්‍රමාද ගාස්තු ලෙස රු. 149,161 ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත දේශීය ඒජන්ත ගාස්තු ඉක්මවා ගෙවන ලද රු.149,161 ක මුදල අනුමැතියක් රහිතව සිදු කරන ලද ගෙවීමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 20 දින අනතුරකට ලක් වූ අමාත්‍යාංශය සතු වාහනයක් සම්බන්ධයෙන් 2016 අගෝස්තු 15 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. .

(ඇ) 2012 දෙසැම්බර් 26 දින අමාත්‍යාංශය සතු වාහනයක් අනතුරට ලක් වීමෙන් සිදු වූ රු.939,173 ක අලාභය සහ තවත් වාහනයක් 2013 අගෝස්තු 11 දින අනතුරට ලක් වීම නිසා සිදු වූ රු.512,080 ක අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 3.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **තාක්ෂණික සහායක තනතුර සඳහා බඳවා ගැනීම.**

අමාත්‍යාංශයේ තාක්ෂණික සහායක තනතුර සඳහා එක් අයෙකු බඳවා ගැනීමේදී, බඳවා ගැනීමේ පරිපාටියේ 7.2.5 වගන්තිය ප්‍රකාරව අඩු පිරිවැය ප්‍රචාරක මාධ්‍යයක් තෝරාගැනීම වෙනුවෙන් පුවත් පත් 03 ක දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු.324,072 ක් වැය කර තිබුණි. බඳවා ගැනීමේදී තනතුර සඳහා අදාළ වෘත්තිය සුදුසුකම වූ NVQ 5 මට්ටම සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් ලිඛිත පරීක්ෂණය පැවැත්විය යුතු වුවත්, රු.324,284 ක් වැය කරමින්, සියළුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට යොමු කර තිබුණි. ලිඛිත පරීක්ෂණයේ දී තෝරාගත් අයදුම්කරුවන් 05 දෙනාම අදාළ වෘත්තිය සුදුසුකම සම්පූර්ණ කර නොතිබූ අතර, තනතුර 2016 අප්‍රේල් 30 දින වන විටත් පුරප්පාඩුව පැවැතුණි. මේ අනුව බඳවා ගැනීම වෙනුවෙන් දරා තිබූ රු.648,35 ක් වූ වියදම නිෂ්ඵල වී තිබුණි.

**(ඇ) අධ්‍යක්ෂ (සංවර්ධන හා සාගර සම්පත්) තනතුර සඳහා වැඩබැලීමට පත්කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 ඔක්තෝබර් 13 දින සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (සංවර්ධන හා සාගර සම්පත්) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව වැඩ බැලීමට පත්කිරීම සඳහා සුදුසු නිලධාරින් අමාත්‍යාංශයේ සිටියදී, ක්‍රම සම්පාදන සේවයේ III ශ්‍රේණියේ නිලධාරිනියක් ස්ථානමාරු කරවාගෙන අදාළ තනතුරේ වැඩ බැලීම සඳහා පූර්ණකාලීනව පත්කර ගෙන තිබුණි.

(ii) 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ජේදය අනුව තනතුරක වැඩ බැලීමේ උපරිම කාලය මාස 03 ක් වුවද, එම විධිවිධානවලට පටහැනිව අදාළ නිලධාරිනිය 2015 ඔක්තෝබර් 01 දින දක්වා වර්ෂ 3 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව සේවයේ යොදවා තිබුණි.

(iii) මිරිදිය ධීවර සම්පත් සංවර්ධනයට අදාළව, 2015 අගෝස්තු 20 දින සිට චීනයේ පැවති පුහුණු පාඨමාලාවක් සඳහා, ධීවර ක්ෂේත්‍රයේ දෙපාර්තමේන්තුගත තනතුරක නිලධාරියෙකු සහභාගී කරවීම වෙනුවට ක්‍රම සම්පාදන සේවයට අයත් නිලධාරිනියක් සහභාගි කරවා තිබුණි. පුහුණුවෙන් සති 03 කට පසු නිලධාරිනිය වෙනත් ආයතනයකට ස්ථාන මාරුවීම හේතුවෙන් ඇ.ඩොලර් 955 ක් වැය කර ලබා දී තිබූ ධීවර ක්ෂේත්‍රයට අදාළ පුහුණුවෙන් අමාත්‍යාංශයට සේවයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**3.17 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 20 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | - | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 116 | 83 | 33 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 54 | 45 | 09 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත්/ අනියම්/ තාවකාලික | 04 | 04 | 02 | 02 |
| | **එකතුව** | **200** | **152** | **50** | **02** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 45 ක් පැවතුණි. 2015 වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිවීම් කෙරෙහි එම පුරප්පාඩු පැවතීම බලපා නොතිබුණු බැවින්, අනුමත කාර්ය මණ්ඩලය අධිඇස්තමේන්තු කිරීමක් හේතුවෙන් තනතුරු පුරප්පාඩුව ඇති වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.